# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,537 - 2008 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2008.02.15

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 170 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 170 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 171 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 177 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 පෙබරවාරි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 පෙබරවාරි මස 08 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මොණරාගල

බිබිල සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක 12859 යටතේ රාජ සන්තක කිරීමට යටත්වූ, අංක 43 ශ්‍රී 1961 දරන ටාටා වර්ගයේ ට්‍රක් රථය විකිණීම සඳහා ටෙන්ඩර්පත් කැඳවනු ලබන අතර, 2008 මාර්තු මස 14 වැනි බදාදා දින පෙ. ව. 9.00 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

(2) ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී, එකී ස්ථානයට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලබන අතර, ටෙන්ඩර් පත්‍ර ඉහත සඳහන් දිනයෙහි දී, මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී විවෘත කරනු ලැබේ.

(3) ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ, 2008 මාර්තු මස 13 දින ප. ව. 3.00 දක්වා අධිකරණ කාර්යාලය වෙතින් ලබා ගත හැකි ඉල්ලුම් පත්‍රයකින් පමණය.

(4) සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුක්තව, එක් කවරයක බහා යොමු කළ යුතු අතර, ටෙන්ඩර්පත් බහා එවන ලිපි කවරයේ උඩ වම් පස කෙළවරේ "අංක 43 ශ්‍රී 1961 දරන ටාටා ට්‍රක් රථය සඳහා ටෙන්ඩර්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු අතර, තම නම සහ ලිපිනය ද, ලිපි කවරයේ වම් පස පහළ කොටසේ සඳහන් ව තිබිය යුතුය.

(5) ටෙන්ඩර්පත් දිසා විනිසුරුතුමා, දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ද එවිය හැකි අතර, කිසියම් ටෙන්ඩර්කරුවෙකු කැමැත්තේ නම්, ස්වකීය ටෙන්ඩර් පත්‍රය මුද්‍රා තබා පෞද්ගලිකව ම හෝ නියෝජිතයෙකු මගින් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දී ඒ බවට, කුවිතාන්සියක් ලබා ගත හැකිය. (එබඳු අවස්ථාවක දී ද, ලිපි කවරයෙහි ඉහත (4) ඡේදයේ කරුණු සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතුය)

(6) ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමේ දී, එක් කට්ටලයක් සඳහා රු. 100 ක පෝර්ම ගාස්තුවක් අය කෙරෙන අතර, ආපසු ගෙවනු ලබන රු. 2,000 ක ඇප තැන්පතුවක් ද, තැන්පත් කළ යුතුය. මෙම ගෙවීම සඳහා කුවිතාන්සිපත් නිකුත් කරනු ඇත.

(7) වැඩිම මිල ඉදිරිපත් කළ ඉල්ලුම්කරුට, බදුල්ල මහාධිකරණ ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු හා එම ටෙන්ඩර් මණ්ඩලය විසින් ම නියම කළ දිනට පෙර සම්පූර්ණ මුදල් ගෙවීමෙන් අදාල රථය ඉවත් කර ගත හැකිය.

(8) ටෙන්ඩරය පිළිබඳ සම්පූර්ණ කොන්දේසි හා විස්තර අධිකරණ කාර්යාලය වෙතින් ලබා ගත හැකිය.

එම්. ඩබ්. ජේ. කේ. වීරමන්,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
මොණරාගල.

2008 ජනවාරි මස 28 වැනි දින,
මොණරාගල,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

02-442

---

# බඩු බාහිරාදිය විකිණීම්

### දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - අත්තනගල්ල

#### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ රාජ සන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අත්තනගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජ සන්තක කරන ලද හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ වර්ෂ 2008.03.08 දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම්, ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 9.00 සිට 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2ට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතුය. චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි, එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පත ද ඉදිරිපත් කළ යුතුය.

ඩබ්. ආර්. ආර්. එන්. වතුපොල,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
නිට්ටඹුව.

2008 ජනවාරි මස 23 වැනි දින,
අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

#### වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව

| | | |
|---|---|---|
| 1. | ඒ. ආර්. 457/04 | අංක 70 -7017945 දරන හොණ්ඩා යතුරු පැදිය |
| 2. | ඒ. ආර්. 1683/06 | අංක 50 ට්, 1099245 දරන යතුරු පැදිය |
| 3. | ඒ. 1546/3 | 105 ශ්‍රී 3082 දරන යතුරු පැදිය |
| 4. | ඒ. 824/04 | 109 ශ්‍රී 5228 දරන යතුරු පැදිය |
| 5. | ඒ. 669/06 | ඒ. එෆ්. 16-1034453 දරන යතුරු පැදිය |
| | | ඒ. එෆ්. 18-1399261 දරන යතුරු පැදිය |
| 6. | ඒ. 1733/05 - 108 | 108 ශ්‍රී 3360 දරන යතුරු පැදිය |
| 7. | ඒ. 1413/06 | 95 ශ්‍රී 1886 දරන යතුරුපැදිය |

| | | |
|---|---|---|
| 8. | 55635 (බී. 631/03) | අංක 143 දරන යතුරු පැදිය |
| 9. | ඒ. 1680/06 | 91 ශ්‍රී 4485 දරන යතුරු පැදිය |
| 10. | ඒ. ආර්. 119/05 | ජී. බී. 5493 දරන යතුරු පැදිය |
| 11. | 70737 (බී. 1488/04) | අංක 27 ශ්‍රී 3944 දරන ලොරි රථය |
| 12. | ඒ. 1362/04 | පාපැදිය |
| 13. | ඒ. 419/06 | පාපැදිය |
| 14. | ඒ. ආර්. 1934/03 | පාපැදිය |
| 15. | ඒ. 482/97 | පාපැදිය |
| 16. | 1412/06 | පාපැදිය |
| 17. | ඒ. 1410/06 | පාපැදිය |
| 18. | ඒ. 1682/06 | පාපැදිය |
| 19. | ඒ. ආර්. 2021/04 | පාපැදිය |
| 20. | ඒ. 2015/05 | පාපැදිය |
| 21. | ඒ. 971/06 | පාපැදිය |
| 22. | ඒ. 1088/02 | අතුමුදුවක් |
| 23. | ඒ. 409/06 | කැඩුණු දඟර වළලු 02 ක් (රන් නොවේ) |
| 24. | ඒ. 408/06 | එන් පෙන්ඩනයක් (නැංගුරමක්) |
| 25. | ඒ. ආර්. 495/06 | කැඩුණු දම්වැලක් (රන් නොවේ) |
| 26. | ඒ. 1460/02 | රන් ගුලියක් හා කැඩුණු කැල්ලක් |
| 27. | ඒ. 475/06 | රන්ගුලි 04ක් |
| 28. | ඒ. ආර්. 587/06 | මුදුවක් |
| 29. | ඒ. ආර්. 1134/00 | රන් ගුලියක් |
| 30. | ඒ. ආර්. 1135/00 | රන් ගුලියක් |
| 31. | ඒ. ආර්. 1139/00 | රන් ගුලියක් |
| 32. | ඒ. ආර්. 1143/00 | රන් ගුලියක් |
| 33. | ඒ. ආර්. 1247/98 | දම්වැල් එකක් |
| 34. | ඒ. ආර්. 557/02 | ටසල් කරාබු දෙකක් |
| 35. | ඒ. 1207/06 | කම්බි ආධාරයකට සවි කරන කොකු 122 |
| 36. | බී. 1711/03 | විසි කැත්ත |
| 37. | ඒ. ආර්. 1144/03 | සී. ඊ. 0168 ජංගම දුරකථනය |
| 38. | 45650 | පොරව |
| 39. | ඒ. ආර්. 1206/00 | ආබාධිත පාපැදියක යකඩ රෝද 03 |
| 40. | ඒ. 1203/05 | යකඩ කැබලි 04 |
| 41. | 48761 | පයිප්ප කීපයක් හා තවත් කොටස් |
| 42. | ඒ. 1411 | ඇඳුම් |
| 43. | ඒ. ආර්. 586/06 | නිල් බෝතල 10 |
| 44. | ඒ. ආර්. 871/05 | බෑගයක් ඇතුළු භාණ්ඩ |
| 45. | 72677 | ගෑස් සිලින්ඩර් 02යි<br>ගෑස්ලිප් 02යි<br>ගෑස් රෙගියුලේටර් 02යි |
| 46. | 63589 | ගෑස් ලිප් 01යි<br>සිලින්ඩර් 01යි |
| 47. | 96009 | ගෑස් ලිප් 01යි<br>සිලින්ඩර් 01යි |
| 48. | 97483 | ගෑස් ලිප් 01යි.<br>සිලින්ඩර් 01යි |
| 49. | ඒ. ආර්. 1821/05 | යකඩ බැරලයක් රබර් නලයක් ඇතුළු භාණ්ඩ |
| 50. | 45647 | ජර්සි දෙකක් |
| 51. | 77005 | වයර් කොටස් |
| 52. | ඒ. 1885/05 | විදුලි පන්දමක් |
| 53. | ඒ. 380/05 | බාල්දි 05ක් හා පිගන් 12ක් |
| 54. | ඒ. 406/06 | කැමරාවක් ඇතුළු භාණ්ඩ |
| 55. | ඒ. 474/06 | ජංගම දුරකථනයක් |
| 56. | 90487 | ගෑස් ලිප් 01යි<br>සිලින්ඩරයක් ඇතුළු භාණ්ඩ. |

02-445

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 163/9 හි පදිංචි සහ දැනට 39, ඊස්ට් 79 වීදිය, අපාර්ට්මන්ට් 8 බී, නිව්යෝක්, එන් වයි 10021, ඇමරිකා එක්සත් ජනපදය හි පදිංචි බාබරා ඩයස් අබේගුණවර්ධන වන මා විසින් අත්සන් කර කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. එස්. කිරිඳිවැල මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 243 සහ 1989.06.08 දින දරන ඇටර්නි බලපත්‍රය මත කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 163/9, හි පදිංචි කල්‍යාණප්‍රිය හේමසිරි ඩයස් අබේගුණවර්ධන යන අයට පවරා තිබූ සියලු බලතල මෙතැන් පටන් අවලංගු වන අතර එකී කල්‍යාණප්‍රිය හේමසිරි ඩයස් අබේගුණවර්ධන විසින් මින්මතු මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මාගේ කිසිදු වගකීමක් හා/හෝ බැඳීමක් නොමැති බව ද ශ්‍රී ලංකා ජනරජයට හා එහි මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

බාබරා ඩයස් අබේගුණවර්ධන.

02-384

## සීමාසහිත ග්ලෝබල් ලීසිං සමාගම සහ සීමාසහිත ග්ලෝබල් හවුසිං ඇන්ඩ් රියල් එස්ටේට් සමාගම ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 241 (4) (ආ) කොටස යටතේ නිකුත් කරන දැන්වීම

2008 මාර්තු මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සීමාසහිත ග්ලෝබල් ලීසිං සමාගම සහ සීමාසහිත ග්ලෝබල් හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් සමාගම ඒකාබද්ධ කිරීම සඳහා එම සමාගම් දෙකෙහි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති බව මහජනතාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

මේ සම්බන්ධ ඒකාබද්ධ කිරීමේ යෝජනාව සීමාසහිත ග්ලෝබල් හවුසිං ඇන්ඩ් රියල් එස්ටේට් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් සීමාසහිත ග්ලෝබල් හවුසිං ඇන්ඩ් රියල් එස්ටේට් සමාගමේ ඕනෑම කොටස් හිමියෙකු, ණය හිමියෙකු හෝ කිසියම් වගකීමක් සඳහා සමාගම බැඳී ඇති ඕනෑම පුද්ගලයෙකු ගේ පරීක්ෂාව සඳහා 2008 මාර්තු 20 වැනි දින දක්වා ප්‍රසිද්ධ හා වෙළඳ නිවාඩු දිනයන් හැර සතියේ වෙනත් ඕනෑම රාජකාරි දිනක පෙ. ව. 8.30 සිට ප. ව. 5.00 දක්වා කාලය තුළ අංක 450, NCCSL ගොඩනැගිල්ල, පළමු මහල, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 යන ස්ථානයේ සමාගම් ලියාපදිංචි කාර්යාලයේ තබා ඇත. මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් ඉහත සඳහන් ඕනෑම පුද්ගලයෙකු ගේ

ඉල්ලීම පරිදි සීමාසහිත ග්ලෝබල් හවුසිං ඇන්ඩ් රියල් එස්ටේට් සමාගම විසින් නොමිලේ ලබාදෙනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය,

සීමාසහිත ග්ලෝබල් හවුසිං
ඇන්ඩ් රියල් එස්ටේට් සමාගම.

02-401

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සෙල්සෙට් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පීවී 62647, 2008 ජනවාරි 08.
ලියාපදිංචි ලිපිනය : අංක 150, ගාලු පාර, වෙල්ලවත්ත.

ලේකම්.

02-402

---

සීමාසහිත ග්ලෝබල් ලීසිං සමාගම සහ සීමාසහිත ග්ලෝබල් හවුසිං ඇන්ඩ් රියල් එස්ටේට් සමාගම ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 241 (4) (ආ) කොටස යටතේ නිකුත් කරන දැන්වීම

2008 මාර්තු මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සීමාසහිත ග්ලෝබල් ලීසිං සමාගම සහ සීමාසහිත ග්ලෝබල් හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් සමාගම ඒකාබද්ධ කිරීම සඳහා එම සමාගම් දෙකෙහි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති බව මහජනතාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

මේ සම්බන්ධ ඒකාබද්ධ කිරීමේ යෝජනාව සිමාසහිත ග්ලෝබල් ලීසිං සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් සීමාසහිත ග්ලෝබල් ලීසිං සමාගමේ ඕනෑම කොටස් හිමියෙකු, ණය හිමියෙකු හෝ කිසියම් වගකීමක් සඳහා සමාගම බැඳී ඇති ඕනෑම පුද්ගලයෙකු ගේ පරීක්ෂාව සඳහා 2008 මාර්තු 20 වැනි දින දක්වා ප්‍රසිද්ධ හා වෙළඳ නිවාඩු දිනයන් හැර සතියේ වෙනත් ඕනෑම රාජකාරි දිනක පෙ. ව. 8.30 සිට ප. ව. 5.00 දක්වා කාලය තුළ අංක 450, NCCSL ගොඩනැගිල්ල, පළමු මහල, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 යන ස්ථානයේ සමාගම් ලියාපදිංචි කාර්යාලයේ තබා ඇත. මෙම ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් ඉහත සඳහන් ඕනෑම පුද්ගලයෙකු ගේ ඉල්ලීම පරිදි සීමාසහිත ග්ලෝබල් ලීසිං සමාගම විසින් නොමිලේ ලබාදෙනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය,

සීමාසහිත ලීසිං සමාගම.

02-400

---

## සමාගමක් සංස්ථාපිත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය.

සමාගමේ නම : රන්වුඩ් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පීවී 62599, දාතම : 2008 ජනවාරි 04
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 372 ඒ හයිලෙවල් පාර, පන්නිපිටිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජේ. වී. ජී. සුමිත්‍ර,
සමාගම් ලේකම්.

02-385

---

## ඇටෝනි බලය අවලංගු කිරීම

මාතර, කඹුරුගමුව තැපැල්, පුවක්වත්ත, සූරියබණ්ඩාරවත්ත, සූරිය නිවස හි පදිංචි හේවාබැට්ටගේ ඥාණවතී එදිරිවීර කරුණාරත්න වන මා වෙත ඉහත ලිපිනයෙහි පදිංචි අරෝෂිකා ඉරන්ති කරුණාරත්න විසින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් ලලිත් හේමකරුණාරත්න අත්සන් සහතික කොට 2005.01.10 අංක 6756 දරන 2005 මාර්තු මස 24 දාතම දමා අංක 3704 හි කොළඹ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොට පැවරූ ඇටෝනි බලපත්‍රය අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

එච්. බී. ඥාණවතී එදිරිවීර කරුණාරත්න,
ඇටෝනි බලපත්‍රලාභී.

02-387

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහනුවර, කටුගස්තොට, මඩවල පාර, කහල්ල, අංක 155/2, හි පදිංචි බෙලිගල ගෙදර චන්දික ප්‍රියන්ජිත් බෙලිගල වන මා විසින් මහනුවර, කටුගස්තොට, මඩවල පාර, කහල්ල, අංක 155/2, හි පදිංචි මාගේ පියා වන බෙලිගල ගෙදර සිරිසේන බෙලිගල නමැති අයට 2003.04.10 වැනි දින එම්. එෆ්. එම්. අස්මි මහජන නොතාරිස් විසින් සහිතක කළ අංක 581 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව ශ්‍රී ලංකා ජන රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී ඇටෝර්නි බලපත්‍රය මා වෙනුවට කරනු ලබන කිසිම ගනුදෙනුවකට මා වග නොකියන බවට ද ප්‍රකාශ කරනු ලැබේ.

බෙලිගල ගෙදර චන්දික ප්‍රියන්ජිත් බෙලිගල.

02-406

---

## නිවේදනයයි

## සීමාසහිත සිලෝන් තියටර්ස් සමාගම සහ සීමාසහිත මිලර්ස් සමාගම ඒකාබද්ධ කිරීම

සීමාසහිත සිලෝන් තියටර්ස් සමාගමේ සහ සීමාසහිත මිලර්ස් සමාගමේ සාමාජිකයින් විසින් 2007 දෙසැම්බර් මස 28 වැනි දින වෙන් වෙන් වශයෙන් පැවැත්වූ අති විශේෂ මහ සභා රැස්වීම්වල දී සමාගම් දෙක එක් ඒකකයක්, සීමාසහිත සිලෝන් තියටර්ස් සමාගම ලෙස 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව ඒකාබද්ධ කිරීමට සම්මත කර ගන්නා ලදී.

සීමාසහිත මිලර්ස් සමාගමේ සාමාජිකයින් සතු සෑම කොටස් 07 සඳහා සීමාසහිත සිලෝන් තියටර්ස් සමාගමේ කොටස් 02 බැගින් නිකුත් කිරීම මගින් මෙම සමාගම් ඒකාබද්ධ කිරීම සිදුකරනු ඇත.

මෙම සමාගම් ඒකාබද්ධකරණය 2008 ජනවාරි මස 31 දින හෝ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් තීරණය කරනු ලබන වෙනත් දිනයකදී සිදු කරනු ඇත.

ඒකාබද්ධ සමාගමේ ලියාපදිංචි කාර්යාලයෙහි ලිපිනය ලෙස අංක 08, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවත, කොළඹ 02, සීමාසහිත සිලෝන් තියටර්ස් සමාගමේ වර්තමාන ලියාපදිංචි ලිපිනය භාවිතා කරනු ඇත.

ඉහතින් සඳහන් කළ සමාගම්වල කොටස් හිමියකු හෝ ණය හිමියෙකු හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුට පරීක්ෂා කිරීම සඳහා යෝජිත ඒකාබද්ධ කිරීමේ යෝජනාවල පිටපත් අංක 08, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවත, කොළඹ 02 හි පිහිටි සීමාසහිත සිලෝන් තියටර්ස් සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ දී සාමාන්‍ය ව්‍යාපාරික වේලාවන්හිදී ලබාගත හැක.

සීමාසහිත සිලෝන් තියටර්ස් සමාගමට හෝ සීමාසහිත මිලර්ස් සමාගමට කරනු ලබන ඉල්ලීමක් මත යෝජිත ඒකාබද්ධ කිරීමේ යෝජනා ඕනෑම කොටස් හිමියකුට හෝ ණය හිමියෙකුට හෝ ඕනෑම පුද්ගලයකුට නොමිලේ ලබාදීමට ඉහතින් සඳහන් කළ සමාගම් බැඳී සිටී.

කළමණාකාර අධ්‍යක්ෂ,
සීමාසහිත මිලර්ස් සමාගම.

සභාපති,
සීමාසහිත සිලෝන් තියටර්ස්,
සමාගම.

02-414

---

## ඉන්ස්ටිටියුට් ඔෆ් ඩිවලොප්මන්ට් ඔෆ් පොසිටිව් සයිකලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 දෙසැම්බර් මස 17 වැනි දින සංස්ථාගත කරන ලද බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම: ඉන්ස්ටිටියුට් ඔෆ් ඩිවලොප්මන්ට් ඔෆ් පොසිටිව් සයිකලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය :පීවී 62432
ලියාපදිංචි කාර්යාලය: අංක 60/2, කෝට්ටේ පාර, කොළඹ 08.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ක්‍රෝව්ලි මැනේජ්මන්ට් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

02-422

---

## කමියුනිටි බේස්ට් එකෝ - ගයිඩ්ස් ඇසෝසියේෂන් ලිමිටඩ්

2007 අගෝස්තු මස 14 වැනි දින සංස්ථාගත කරන ලද බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම: කමියුනිටි බේස්ඩ් එකෝ - ගයිඩ්ස් ඇසෝසියේෂන් ලිමිටඩ්
සමාගමේ අංකය :ජීඑල් 2003
ලියාපදිංචි කාර්යාලය: අරුගම්බේ, මහ වීදිය, පොතුවිල්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ක්‍රෝව්ලි මැනේජ්මන්ට් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

02-421

---

## ශික්ෂා මන්දිර පබ්ලිකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 දෙසැම්බර් මස 17 වැනි දින සංස්ථාගත කරන ලද බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම: ශික්ෂා මන්දිර පබ්ලිකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය :පීවී 62431
ලියාපදිංචි කාර්යාලය: අංක 60/2, කෝට්ටේ පාර, කොළඹ 08.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ක්‍රෝව්ලි මැනේජ්මන්ට් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

02-420

## විශේෂ ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ඉගිණියාගල කඳුමාවත අංක 01 හි පදිංචි රණසිංහ මුදියන්සේලාගේ චතුරංග ලක්වීර හිග්ගොඩ වන මම මහජනතාවට මෙයින් දන්වා සිටින්නේ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පත්මි උදේණිකා අබේසිරිවර්ධන නොතාරිස් විසින් ලියා සහතික කළ වර්ෂ 2007 ක් වූ සැප්තැම්බර් මස (09) 13 වැනි දිනැති අංක 218 දරන කොළඹ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියා පදිංචි කිරීමේ බලයලත් ලේඛනයේ 117 කාණ්ඩයේ 11896 පත් ඉරුවේ 371 දින පොතේ අංකය යටතේ 2007ක් වූ නොවැම්බර් මස 09 වැනි දිනයේ ලියාපදිංචි කර ඇති ඇතුරුගිරිය සමනල මාවත අංක 46/17 දරන ස්ථානයේ පදිංචි දෝන ගංගා කුමාරි ඉලේපෙරුම (විවාහයට පෙර පත්බේරිය) යන අය විසින් මා වෙත දී ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන බවය. මින් ඉදිරියට එකී ඇටෝර්නි බලලාභීවන මා ඇටෝර්නි බලකරු වෙනුවෙන් කරුණු ලබන කිසිදු ගණු දෙණුවකට හෝ වෙන යම් බැඳීමකට මා විසින් වගකීමක් නොමැති බව ද මා වැඩි දුරටත් මෙයින් දැනුම් දෙමි.

මෙයට, ඇටෝර්නි බලලාභි
ආර්.එම්. සී. එල්. හිග්ගොඩ.

අංක 01, කඳු මාවත,
ඉගිණියාගල.

02-426

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම: පී. ජේ. පී. හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2007.11.14
සමාගමේ අංකය : පීවී 62025
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 39/බී, අංගම්පිටිය පාර,
ඇතුල්කෝට්ටේ, කෝට්ටේ.

කෝපරේට් ප්‍රොෆෙසනල් සර්විසස් (පුද්) සමාගම,
සමාගම් ලේකම්වරු.

අංක 37/1, කාසල් වීදිය, කොළඹ 08.

02-455

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය අනුව, මා විසින් පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බව දැනුම් දෙමි.

සමාගමේ නම: නිව් ග්ලෝබ් ලොජිස්ටික් ලංකා (පෞද්ගලික) සමාගම
(New Globe Logistik Lanka (Private) Limited
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 61726
සමාගමේ ලිපිනය : අංක 149, ෆ්‍රෙට් හවුස්, යූනියන් පෙදෙස, කොළඹ 02
සමාගම ලියාපදිංචි කළ දිනය : 2007 සැප්තැම්බර් මස 17 වැනි දින

සමාගමේ ලේකම්,

නිව් ග්ලේබ් ලොජිස්ටික් ලංකා (පෞද්ගලික) සමාගම.

02-403

---

## දැන්වීමයි

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ දැනුම් දීමයි

අංක 72 ඒ, කුරුස හන්දිය, බෝපිටිය, පමුණුගම යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි, ලියාපදිංචි අංක පීවී 62628 දරන, රයන් ඇන්ඩ් රෙෂෝන් ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් සමාගමක් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2008 ජනවාරි මස 07 වැනි දින සංස්ථාපනය කළ බවට දැනුම් දීමයි.

අධ්‍යක්ෂක,
රයන් ඇන්ඩ් රෙෂෝන් ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2008 ජනවාරි මස 17 වැනි දින.

02-413

---

## දැන්වීමයි

### 2007 අංක 7 දරන සමාගම් පනත 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය

සමාගමේ නම : රේන්බෝ ප්‍රින්ට් ඉන්ටර්නැෂනල් කම්පැනි (පුද්ගලික) සමාගම
සංස්ථාගත අංකය : පී වී 62858
සංස්ථාගත කළ දිනය : 2008.01.29
ලියාපදිංචි කාර්යාලය: 37 ඒ/3, හුලුදාගොඩ පාර, ගල්කිස්ස.

සමාගම් ලේකම්.

02-410

## ඇටර්නි බලය අවලංගු කිරීම

රත්නපුර දැල, "ලහිරු" හි පදිංචි ගම්වාරි නදී අසේලා විද්‍යාලංකාර වන මා විසින් එම ගම පදිංචි හේවාදූව ගොඩැල්ලගේ වුලක්ෂ මනෝජිත හෙවත් මනෝජ් යන අය වෙත රක්වානේ පදිංචි තිවංක ජයසූරිය ප්‍රසිද්ධ නොතාරිස් තැන සහතික කරන ලද අංක 8187 සහ 2005.10.27 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් ප්‍රදානය කරන ලද ඇටර්නි බලකාර භාවය අද පටන් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බවත්, එකී හේවාදූව ගොඩැල්ලගේ වුලක්ෂ මනෝජිත හෙවත් මනෝජ් මින් ඉදිරියට මාගේ ඇටර්නි බලකරු වශයෙන් කටයුතු නොකරන බවත් අද පටන් ඔහු විසින් එළඹෙන කවර හෝ ගනුදෙනුවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ආණ්ඩුවටත් මහජනතාවටත් මෙයින් දැනුම් දී සිටි.

ගම්වාරි නදී අසේලා විද්‍යාලංකාර .

2007 ඔක්තෝබර් මස 17 වැනි දින,
රත්නපුර දී ය.

02-368

---

## ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

අංක 766, හයිබරි පාර, ග්ලෙන් වේබර්ලි, වික්ටෝරියා, ඕස්ට්‍රේලියාහි පදිංචි, මාලිනී මල්ලිකා දූවගේ වන මම, අංක 14, රයින්ලන්ඩ් පෙදෙස, කොළඹ 03, පදිංචි කුමාරන්නැහැලාගේ ජයන්ත කුමාර යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත් කරමින්, වික්ටෝරියා ඕස්ට්‍රේලියාවෙහි පදිංචි වී. එස්. සචින්තා නන්දම්, සොලිසිටර් විසින් සහතික කළ 14230 සහ 03.11.2004 දරන, ඇටර්නි බලපත්‍රය අවලංගු කළ බව මෙයින් සියළු දෙනා වෙත දන්වමි.

තව ද එකී බලපත්‍රය යටතේ මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වග නොකියන බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

මාලිනී මල්ලිකා දූවගේ,
වික්ටෝරියා,
ඕස්ට්‍රේලියාව.

02-347

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සෝෂල් විජිලන්ස් ඕගනයිසේෂන් යන සමාගම ඇපයෙන් සීමාසහිත සමාගමක් වශයෙන් වර්ෂ 2007 ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : සෝෂල් විජිලන්ස් ඕගනයිසේෂන්
සමාගමේ අංකය : GA 2058
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 18, කතිරේෂන් පාර,
වැරවැපුලියන්කුලම්, වවුනියාව

බ්‍රිලියන්ට් ප්‍රෝමෝටස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

02-333

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : සුපර් කූල් ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ අංකය : පී. වී. 61662
3. සංස්ථාගත කළ දිනය : 2007 ඔක්තෝබර් 10
4. ලියාපදිංචි කල කාර්යාලයේ ලිපිනය : අංක 225, හයිලෙවල් පාර, මහරගම.

අධ්‍යක්ෂක.

02-319

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : ස්ටීල්මෙට් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ අංකය : පී. වී. 62486
3. සංස්ථාගත කළ දිනය : 2007 දෙසැම්බර් 24
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 81-1/1, මහ විද්‍යාල මාවත, කොළඹ 13.

අධ්‍යක්ෂ මණ්ඩලය.

02-320

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : ඔලිව් ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ අංකය : පී. වී. 62482
3. සංස්ථාගත කළ දිනය : 2007 දෙසැම්බර් 24
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 121, මෝදර වීදිය, කොළඹ 08.

අධ්‍යක්ෂ මණ්ඩලය.

02-321

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

1. සමාගමේ නම : කෙයිහින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ අංකය : පී. වී. 62609
3. සංස්ථාගත කල දිනය : 2008 ජනවාරි 04
4. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 338/ඒ, සෝමානන්ද මාවත, අරුක්වත්ත උතුර, පාදුක්ක.

අධ්‍යක්ෂක මණ්ඩලය.

02-322

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නාමය : ඉකොනොමික් රිසර්ජන්ස් ඇසෝසියේසන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : **N (PVS)** 37599
ලියාපදිංචි කාර්යාලය: අංක 13, ඩී. ෆොන්සේකා පෙදෙස, කොළඹ 04.
සමාගමේ නව නාමය : සෙලින්කෝ ඊරා (ප්‍රයිවට්) ලිමිටඩ්

ඉන්ටනැෂනල් කන්සල්ටන්සි ඇන්ඩ් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලේකම්වරු.

02-303

### සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 7 දරන ඡෙදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි.

සමාගමේ නම : කොන්ටිනෙන්ටල් ක්ලෝතින්ග් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය සහ දිනය : **PV** 62401, 14.12.2007
ලියාපදිංචි ලිපිනය : දොරනෙගම පාර, මැදවෙල, හාරිස්පත්තුව.

සමාගම් ලේකම්,
නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම.

02-263

### සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 7 දරන ඡෙදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි.

සමාගමේ නම : වෝටර් වර්ක්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය සහ දිනය : **PV** 62666, 09.01.2008
ලියාපදිංචි ලිපිනය : අංක 1 **E**, බාර්න්ස් පෙදෙස, කොළඹ 07.

සමාගම් ලේකම්,
නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම.

02-262

### සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 7 දරන ඡෙදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි.

සමාගමේ නම : පවර්ජෙන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්)
ලියාපදිංචි අංකය සහ දිනය : **PV** 62665, 09.01.2008
ලියාපදිංචි ලිපිනය : අංක 1 **E**, බාර්න්ස් පෙදෙස, කොළඹ 07.

සමාගම් ලේකම්,
නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම.

02-261

### සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 7 දරන ඡෙදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි.

සමාගමේ නම : කැම්බල්වයිට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය සහ දිනය : **PV** 62254, 12.12.2007
ලියාපදිංචි ලිපිනය : අංක 98, සාන්ත අන්තෝනි මාවත, කොළඹ 03.

සමාගම් ලේකම්,
නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම.

02-260

**සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම**

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 7 දරන ඡෙදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි.

සමාගමේ පූර්ව නම : Lanka Suvin (Pvt) Ltd.
සමාගමේ අලුත් නම : Lanka Svin (Pvt) Ltd.
ලියාපදිංචි අංක : **N(PVS)** 48282
ලියාපදිංචි ලිපිනය : අංක 102/32 ජී, සමරනායක වත්ත, ප්‍රධාන පාර, කඳාන.

සමාගම් ලේකම්,
නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම.

02-259

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ හැටන් චෙම්බර් ඔෆ් කොමර්ස් ඉන්ඩස්ට්‍රි ඇන්ඩ් ඇග්‍රිකල්චර් යන සමාගම ඇපයෙන් සීමාසහිත සමාගමක් වශයෙන් වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 14 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : හැටන් චෙම්බර් ඔෆ් කොමර්ස් ඉන්ඩස්ට්‍රි ඇන්ඩ් ඇග්‍රිකල්චර්
සමාගමේ අංකය : ජීඒ 2064
සමාගම් ලියාපදිංචි කාර්යාලය : අංක 94 ඒ, තෙවන මහල, සයිඩ් වීදිය, හැටන්.

බ්‍රිලියන්ට් ප්‍රෝමෝටස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

02-332

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ඩීඑෆ්සීසී බැංකුව**
(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

***අංක 1229 ඇපකරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර***

වයඹ පළාත, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි, මහව ඩීආර්ඕ කොට්ඨාසයට අයත්, ගන්තිහ කෝරළේ, ඉපලෝගම 36 හි කොන්වැවේ පිහිටි, මිනින්දෝරු ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද, උප අංක 01 හා පිඹුරුපත් අංක 1983හි, ලොට් අංක 148 ලෙස සඳහන් 'ගොඩකිරිල්ලගහමුලහේන' ලෙස හඳුන්වන ඉඩම. ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 0.197 එහි පිහිටි සියල්ල සහිතව මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් විශාකා පී. දිසානායක මහත්මිය විසින් සහතික කරන ලද, 1996 සැප්තැම්බර් මස 16 දිනැති අංක 1229 උකස්කරය ප්‍රකාර, කොන්වැව 'මහව' 'EMK ස්ටෝර්ස් ' නම් ව්‍යාපාරය හවුලේ පවත්වාගෙන යන, කොන්වැව, මහව පදිංචි ඒකනායක මුදියන්සේලාගේ කලුබණ්ඩා, අධිකාරී මුදියන්සේලාගේ මැණික්හාමි, ඒකනායක මුදියන්සේලාගේ ඒකනායක හේරත්, ඒකනායක මුදියන්සේලාගේ තිස්ස ඒකනායක හා ඒකනායක මුදියන්සේලාගේ ගාමිණී ඒකනායක යන අය විසින්, ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නො කරන ලද දේපළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2008 මාර්තු මස 05 වැනි දින (බදාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පලාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර)
4. රු. 26,150.00ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංක 011- 2442442.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ISO 9001: 2000 සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
උපදේශක, තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

ප්‍රධාන කාර්යාලය:
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : **schokmankandy@sltnet.lk**

නගර කාර්යාලය:
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 2588176
ඊමේල් : **schokma @sameran 1892.com**

**02-411**

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - බොරැල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2006.08.28 දින සහ අංක 2757 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තෙබුවන්ගේ නිහාල් ප්‍රනාන්දු සහ අජන්ත ප්‍රබාන්ති ගුණතිලක ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් සී/ස. හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ මාර්තු මස 3 වැනි දින පෙ. ව. 11.00ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ඒකකයේ, තලංගම පිහිටි ගොඩපොරගහවත්ත නමින් හඳුන්වන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩමට බලයලත් මානක ඩී. ටී. ඒ. දිසානායක විසින් මැන සාදන ලද 2003.06.18 දිනැති අංක 1660 දරන පිඹුරේ ලොට් 1 ලෙස සලකුණු කරන ලද ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේත් සහ ඉහත කී අංක 2757 දරන පිඹුරේ දෙවන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

විශාලත්වය : පර්චස් 07යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.06.29 දින දරන *ගැසට් පත්‍රය* හා 2007.08.14 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)' ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%)' ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් (රු. 500) ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සී/ස. හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම බුයිඩ්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංක : 2863121

02-386

### සෙලාන් බැංකුව පීඑල්සී - දෙහිවල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

ලොට් 4 වශයෙන් ලකුණු කොට ඇති බෙදා වෙන්කොට නිර්නය කළ සම්පූර්ණ ඉඩම් කොටස බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලෙ පත්තුවේ, කෝට්ටේ නගර සභා සීමාව ඇතුළත පිටකෝට්ටේ, පාගොඩ පාරේ, පිහිටි පාගොඩ පාරේ වරිපනම් අංක 129 දරන 'කපුවත්ත සහ කජුගහවත්ත' නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් පිළියෙල කළ 1989 ඔක්තෝබර් මස 15 දාතම හා අංක 7132 දරන පිඹුරේ ලොට් 4 වශයෙන් දක්වා ඇති (ප්‍රමාණයෙන් පර්චස් 22.30ක ඉඩම) බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් පිළියෙල කළ 1989 ඔක්තෝබර් මස 15 දාතම හා අංක 7132 දරන පිඹුරේ දැක්වෙන (මාර්ගය සඳහා රක්ෂිතය) ලොට් 3 වහයෙන් ලකුණු කොට බෙදා වෙන්කොට නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස ඉහළින් යටින් හා අතරින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග සහ පිටකෝට්ටේ, පාගොඩ පාරේ පිහිටි 'දෙල්ගහවත්ත' නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩී. ඒ. එෆ්. යාපා විසින් පිළියෙල කළ 1976.12. 01 දාතම හා අංක 491 දරන පිඹුරේ දැක්වෙන (ප්‍රසිද්ධ නොතාරිස් පී. ජේ. එම්. කුමාරසිරි විසින් ලියා සහතික කළ 1989 ජුනි 15 දාතම හා අංක 6 දරන තෑගි ඔප්පුවේ සඳහන් කොට ඇති ගමන් කිරීම සඳහා මාර්ග අයිතිය ඇති මාර්ග රක්ෂිතය හා වෙනත් අයිතින්)

ලොට් අංක 2 වශයෙන් ලකුණු කොට ඇති බෙදා වෙන්කොට නිර්ණය කළ ඉඩම් කොටස ද සමග (පිටකෝට්ටේ, පාගොඩ පාරේ අංක 129 හි සෙල්ලහෙන්නැදි ගලප්පත්තිගේ මහින්දදාස උකස්කරු/බැඳුම්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ජී. එල්. එච්. එච්. සිල්වා විසින් ලියා සහතික කළ 1998 ඔක්තෝබර් මස 8 දාතම හා අංක 1367 දරන බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් සීමාසහිත සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර 2008 මාර්තු මස 4 වැනිදා අඟහරුවාදා පෙ. ව. 10.00 ට ආරම්භව පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මතය පිළිබඳ නිවේදනය සඳහා 2001.04.12 දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2001.04.04 ඩේලි නිව්ස්, දිනමිණ හා තිනකරන් පුවත්පත් ද සහ විකුණුම් නිවේදනය සඳහා 2008.02.15 දින *රජයේ ගැසට් පත්‍රය ද* බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*-

1. මිල තීන්දු වූ වහාම ගැණුම් මිළෙන් 10%,
2. ගැණුම් මිළෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට වැඩ කරන දින 30ක් ඇතුළත,
3. පලාත් අධිකාරියට ගෙවිය යුතු දේශීය විකුණුම් බද්ද (සියයට එකක් පමණයි),
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
5. රු. 40,540.62 නොඉක්මවන සම්පූර්න ප්‍රචාරක වියදමින් 50%,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව ැ. 500.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපි ලේඛන, කොළඹ 3, ගාලු පාරේ, අංක 90 හි සෙලින්කෝ සෙලාන් ටවර්හි, 12 වන මහලේ, සෙලාන් බැන්ක්

පීඑල්සී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති දෙපාර්තමේන්තුව) වෙතින් ලබාගෙන පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථන අංක 4701000, 2456789.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්
රජයේ සහතිකලත් විශේෂඥ වෙන්දේසිකරු
තක්සේරුකරු සහ දේපළ නියෝජිත.

අංක 42 දුටුගැමුණු වීදිය, පාමංකඩ, දෙහිවල,
දුරකථන අංක : 2814743 දුරකථන/ෆැක්ස් අංක : 2814742, 2814744
ක්ෂණික ඇමතුම : 0772 - 250422

02-423

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

කොච්චිකඩේ, පලඟතුරේ, පෝරුතොට පාර, අංක 144 හි පදිංචි නෙවිල් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු මහතා සහ වික්‍රමසිංහ ආරච්චිගේ රාණි මැටිල්ඩා මහත්මිය හා මීගමුව, ඇත්තුකැල, අංක 133/1, හි පිහිටි රාණි සමූහ ව්‍යාපාරයේ ණය වගකීම් සඳහා උකස් කළ දේපල - බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ අලුත්කුරු කෝරලයේ දූනගහපත්තුවේ පලඟතුරේ බටහිර හි පිහිටි දොඹගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. අයි. ප්‍රනාන්දු විසින් සාදන ලද 1987.04.03 දිනැති අංක 2277 දරන පිඹුරේ ලොට් අංක 13 සහ 13 ඒ.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 දෙසැම්බර් මස 22 දිනැති අංක 1477 දරන *ගැසට් පත්‍රයේ* හා 2006 දෙසැම්බර් මස 29 දිනැති අංක 1478 දරන *ගැසට් පත්‍රයේ* හා 2006.12.15 ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2008 මාර්තු මස 8 වැනි දින පෙ. ව. 11.30 ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 මහානාම ඩ්‍රයිව් හි පදිංචි ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ අලුත්කුරු කෝරලයේ, දූනගහපත්තුවේ , බටහිර පලඟතුරේ හි පිහිටි දොඹගහවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. අයි. ප්‍රනාන්දු විසින් සාදන ලද 1987.04.03 දිනැති අංක 2277 දරන පිඹුරේ විස්තර කළ ලොට් 13 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ ද නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : මෙම ඉඩමේ කොටසක් ද, නැගෙනහිරට : අංක 2277 දරන පිඹුරේ ලොට් 12 ද, දකුණට : එකී අංක 2277 දරන පිඹුරේ විස්තර කළ ලොට් 13 ඒ ද, බස්නාහිරට: එකී අංක 2277 දරන පිඹුරේ ලොට් 14 ද, මායිම්ව රූඩ් එකයි පර්චස් දහයයි දශම හතක (අ. 0 රූ. 1 පර්. 10.7) බිම්ප්‍රමාණය සමග එහි පිහිටි වැව්ලි සමග අංක 1926 දරන පිඹුරේ ලොට් 7 වශයෙන් සඳහන් අඩි 20ක් පළල වෙන්කළ පාර පාවිච්චි කිරීමේ අයිතිය සමග එකී ඉඩම් කැබලිවලට හා ඉඩම් කැබලිවල සිට ප්‍රවේශ කිරීමට එකී අංක 2277 දරන පිඹුරේ විස්තර කළ නැගෙනහිරට අඩි 20ක් පලල හා අඩි පහළොවක් පළල ප්‍රවේශය මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය ද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 889/177 හි ලියාපදිංචි කර ඇත.

එකී බටහිර පලඟතුරේ පිහිටි දොඹගහවත්ත නැමැති ඉඩම, එකී අංක 2277 දරන පිඹුරේ විස්තර කළ ලොට් 13 ඒ වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ ද නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට: අංක 2277 දරන පිඹුරේ විස්තර කළ ලොට් 13 ද, නැගෙනහිරට: එකී අංක 2277 දරන පිඹුරේ විස්තර කළ ලොට් 12 ඒ ද, දකුණට : එකී අංක 2277 දරන පිඹුරේ අඩි 20ක් පළල ප්‍රවේශය වූ ලොට් 7 ද, බස්නාහිරට : අංක 2277 දරන එකී පිඹුරේ විස්තර කළ ලොට් 14 ඒ ද, මායිම්ව පර්චස් නවයයි දශම තුනක (අ. 0 රූ. 0 පර්. 9.3) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ සමග අංක 1926 දරන පිඹුරේ ලොට් 7 වශයෙන් සඳහන් අඩි 20ක් පළල වෙන්කළ පාර පාවිච්චි කිරීමේ අයිතිය සමග එකී ඉඩම් කැබැලිවල සිට හා ඉඩම් කැබලිවලට ප්‍රවේශ වීමට එකී අංක 2277 දරන පිඹුරේ විස්තර කළ නැගෙනහිරට අඩි 20ක් පළල හා අඩි 15ක් පළල ප්‍රවේශ මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය ද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 889/178 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ධනංජය සිල්වා,
සම්බන්ධතා කළමනාකරු,
(අයකර ගැනීම් - ආයතනික).

ලංකා බැංකුව,
අයකර ගැනීම් ආයතනික ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

02-429

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

මීගමුව, ඇත්තුකැල අංක 133/1, හි පිහිටි රාණි සමූහ ව්‍යාපාරයේ ණය වගකීම් සඳහා උකස් කළ දේපල බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ අලුත්කුරු කෝරලයේ, දූනගහපත්තුවේ,

බටහිර පලඟතුරේ හි පිහිටි දොඹගහවත්ත නැමති ඉඩමේ ලොට් අංක 14 සහ 14 ඒ.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 දෙසැම්බර් මස 22 දිනැති අංක 1477 දරන *ගැසට් පත්‍රයේ* හා 2006 දෙසැම්බර් මස 15 දිනැති ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2008 මාර්තු මස 8 වැනි දින පෙ. ව. 10.30 ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 මහානාම ඩ්‍රයිව් හි පදිංචි ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ අලුත්කුරු කෝරලයේ, දූනගහපත්තුවේ , බටහිර පලඟතුරේ හි පිහිටි දොඹගහවත්තේ ලොට් 14 නැමැති බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට: මෙම ඉඩමේ කොටසක් ද, බලයලත් මිනින්දෝරු ආර්. අයි. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 1386 දරන පිඹුර, නැගෙනහිරට: ලොට් 13 ද, දකුණට: ලොට් 14 ඒ ද, බස්නාහිරට :ලොට් 17, 16 සහ 15 ද, මායිම්ව පර්චස් දාහතයි දශම තුනක (අ. 0 රූ. 0 පර්. 17.3) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි වැවිලි සහ සියලු දේ වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 633/35 හි ලියාපදිංචි කර ඇත.

එකී පලඟතුරේ හි, පිහිටියා වූ ද එකී අංක 2277 දරන පිඹුරේ විස්තර කළ දොඹගහවත්තේ ලොට් 14 ඒ වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ ද නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට: ලොට් 14 ද, නැගෙනහිරට: ලොට් 13 ඒ ද, දකුණට :බලයලත් මිනින්දෝරු ආර්. අයි. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 1926 දරන පිඹුරේ ලොට් 7 වශයෙන් සඳහන් අඩි 20ක් පළල වෙන්කළ පාරද, බස්නාහිරට: ලොට් 17 ඒ ද, මායිම්ව පර්චස් දෙකයි දශම හතක (අ. 0 රූ. 0 පර්. 2.7) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග වැවිලි සහ පිහිටි සියලු දේ වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 633/36 හි ලියාපදිංචි කර ඇත.

තවද, අංක 2277 දරන පිඹුරේ අඩි 20ක් පළල අයිති පාර වශයෙන් ලොට් 7 පාවිච්චි කිරීමේ අයිතිය ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ධනංජය සිල්වා,
සම්බන්ධතා කළමනාකරු,
(අයකර ගැනීම් - ආයතනික).

ලංකා බැංකුව,
අයකර ගැනීම් ආයතනික ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

02-428

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

මීගමුව අත්තුකැල, අංක 133/1 හි පිහිටි රාණි සමූහ ව්‍යාපාරයේ ණය වගකීම් සඳහා උකස් කළ දේපළ මීගමුව, ඇත්තුකැල හි පිහිටි මට්ටක්කුලියේ පල්ලම නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. එල්. කෲෂ් දාබ්රේරා විසින් සාදන ලද 1990.10.27 දිනැති අංක 5573/1990 දරන පිඹුරේ විස්තර කළ ලොට් බී 1.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 දෙසැම්බර් මස 22 දිනැති අංක 1477 දරන *ගැසට් පත්‍රයේ* හා 2006 දෙසැම්බර් මස 15 දිනැති ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2008 මාර්තු මස 8 වැනි දින ප. ව. 2.30 ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි පදිංචි ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ සහ මහ නගර සභා සීමාවේ ඇත්තුකැල හි පිහිටි මට්ටක්කුලියේ පල්ලම නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. එල් කෲෂ් දාබ්රේරා විසින් සාදන ලද 1990.10.27 දිනැති අංක 5573/1990 දරන පිඹුරේ විස්තර කළ ලොට් බී 1 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ ද නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට: පාරද, නැගෙනහිරට: ඕසීස් බීච් හෝටලයේ ලොට් බී 2 ද, දකුණට: එන්. ජේ. කුරේගේ ලොට් සී ද, බස්නාහිරට : පාර ද (මහා මාර්ග) මායිම්ව පර්චස් විසිපහක (අ. 0 රූ. 0 පර්. 25) ප්‍රමාණයෙන් යුක්ත වේ. එකී ඉඩම් කැබැල්ල පහත විස්තර කළ ඉඩමෙන් නැවත මනින ලද්දකි.

බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (දැන් මීගමුව මහ නගර සභා සීමාව තුළ) අලුත් කුරු කෝරළයේ, දූනගහපත්තුවේ ඇත්තුකැල හි පිහිටි මට්ටක්කුලියේපල්ලම නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද 1990.09.07 දිනැති අංක 9211 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ , කොටස, උතුරට : අඩි 10 පළල පාරද, නැගෙනහිරට: අංක 1631 දරන පිඹුරේ ලොට් බී 2 ද, දකුණට: ලොට් සී ද, බස්නාහිරට: මීගමුව සිට කොච්චිකඩේ දක්වා පාරද ද, (මහා මාර්ගය) මායිම්ව පර්චස් විසිහතරයි දශම හතරක (අ. 0 රූ. 0 පර්. 24.4) බිම් ප්‍රමාණය සමග ගොඩනැගිලි වැවිලි සහ පිහිටි සියලු දේ සහ පෝරුතොට පාර වරිපනම් අංක 116 සහ 116/1 දරන ගොඩනැගිලි ගහකොළ වැවිලි

හා සියලු දේ සමග උතුරට : පිහිටි අඩි 10 ක් පළළ පාර පාවිච්චි කිරීමේ අයිතිය ද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 690/275 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ධනංජය සිල්වා,
සම්බන්ධතා කළමනාකරු,
(අයකර ගැනීම් - ආයතනික).

ලංකා බැංකුව,
අයකර ගැනීම් ආයතනික ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

02-427

---

## මහජන බැංකුව - ඕල්කොට් මාවත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ අධිකාරී පත්තුවේ මාකොළ උතුර පිහිටි මීගහවත්ත හා කැටකැලගහවත්ත හා හපුගහවත්ත, ඇටඹගහවත්ත හා පබුලුමුල්ලවත්ත බ/මී එම්. ඩී. කේ. වී. පෙරේරා විසින් සාදන ලද අංක 1367 දරන 1981.07.04 දින සහ 2000.10.19 සත්‍ය පිටපත් ලෙස නිකුත් කරන ලද මානක පිඹුරේ අංක 07 ලෙස ලකුණු කර ඇති පර්චස් විස්සකින් යුත් බෙදා වෙන් කළ (පර්. 20) විශාල බිම් කොටස ගම්පහ ඉඩම් ලියාපදිංචි සී 573/28 සහ පර්චස් තුනයි. දශම දෙකයි පහකින් යුක්ත වූ හා ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 554/75 යටතේ ලියාපදිංචි කිරීමේ ඇති එකී අංක 5430 ඒ දරන පිඹුරේ විස්තර කර ඇති හයවන බිම් කට්ටිය මත හා ඒ දිගේ මාර්ග අයිතිය සහිත එහි පිහිටි සියලු දේ මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008 මාර්තු මස 08 වැනි දින පෙ. ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2006.11.16 වැනි දින පුවත්පත් මගින් ද 2006.12.01 දින *ගැසට් පත්‍රයේ* පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.* - කිරිබත්ගොඩ මාකොළ පාරේ ටික දුරක් ගියවිට දේවාල පාර හමු වේ. එම පාරේ කි. මීටර් 2ක් පමණ ගිය විට පාරෙන් වමට අදාල දේපල පිහිටා ඇති අතර, එහි වැඩ නිම නොකළ බිත්ති පමණක් බැඳ ඇති නිවසක් සහ පර්චස් 20 ක ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසියේ අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 01%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා වෙනත් ගාස්තු.

ගැණුම් මිළෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ 01 ආදිපාද වීදියේ අංක 11 හි පිහිටි මහජන බැංකු බටහිර කලාප කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරි බටහිර කලාප 01 වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 2393678, 2387068 ෆැක්ස් 011-4717009 හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබගත හැක.

ඉහත සඳහන් පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
සාමවිනිසුරු වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ,
දුරකථන අංක : 2810145, 0777-212602.

02-405/1

---

## මහජන බැංකුව - නුගේගොඩ නගර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මිරිහානේ මහවත්ත පාර පිහිටියාවූ ද 'ඇපලගහ වත්ත' යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. එම්. දිසානායක මහතා විසින් සාදන ලද අංක 767 දරන 1996 ජනවාරි මස 10 වැනි දින සාදන ලද පිඹුරේ ලොට් 1 ලෙස සලකුණු කොට නිරූපනය කර ඇත්තාවූ ද උතුරට: මහවත්ත පාරේ වරිපනම් අංක 27/2 හා 27/1ඒ දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : මහවත්ත පාර ද, දකුණට : ලොට් අංක 2 හා මහවත් පාරේ වරිපනම් අංක 25/1 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : මහවත්ත පාරේ වරිපනම් අංක 25/1 දරන පරිශ්‍රය ද මායිම් වන්නාවූ ද එකී අංක 767 දරන පිඹුරට අනුව පර්චස් අටයි දශම හතක් (අක්. 0 රූඩ් 0 පර්. 8.7) විශාල වූ

ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගහකොළ වැවිලි සහ වෙනත් සියලු දේ මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ ඉහත කී දේපල ම විසින් 2008 මාර්තු මස 05 වැනි බදාදා පෙ. ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2007.12.07 *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2007.12.20 දිනැති ඩේලිනිවුස් හා දිනමිණ පුවත් පත්වල පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.* - නුගේගොඩ සිට අංක 118 බස් මාර්ගයේ ජුබිලි කණුව දක්වා ගොස් එතැනින් එක්වත්ත පාරේ මීටර් 100ක් පමණ ගිය විට වම් අතට විහිදෙන මහවත්ත පාර හමු වේ. එය අඩි 15ක් පමණ තාර දැමූ පාරකි. එම පාරේ මීටර් 100ක් පමණ ගිය විට පාරේ වම් පසින් පාරට මායිම්ව මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසියේ අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවිම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 01%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නුගේගොඩ, ස්ටැන්ලි තිලකරත්න මාවත, අංක 102 හි පිහිටි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ කලාපීය ජ්‍යෂ්ඨ කළමනාකරු බටහිර කලාප 11 වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක 2811007, 2825101, 2854189 ෆැක්ස් 011-2768018 හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
සාමවිනිසුරු වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ,
දුරකථන අංක : 2810145, 0777-212602.

02-405/2